# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2441/06 - 2025 ජුනි මස 17 වැනි අඟහරුවාදා - 2025.06.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී.21/78(XVI)(C)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2025 ජුනි මස 12 වැනි දින,
කොළඹ දී ය.

*නියමාවලිය*

2003 අප්‍රේල් මස 03 වන දින අංක 1282/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2003 අංක 1 දරන ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතන නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1). එහි 3 වන ඡේදයේ -

(අ) (ආ), (ඇ) සහ (ඈ) අනුඡේද ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(ආ) ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි ජෛවරසායන විද්‍යාවේ අණුක ජෛව වේද හා ජෛව තාක්ෂණ විද්‍යාවේ, අණුක ජීව විද්‍යාවන්හි ජෛව තොරතුරුවල, සෛලීය සහ අණුක ප්‍රතිශක්ති විද්‍යාවේ සහ ආශ්‍රිත අධ්‍යයන ක්ෂේත්‍රයන්හි යම් අංශවල අධ්‍යාපනය, පුහුණුව, පර්යේෂණ සහ සංවර්ධනය මෙන්ම උපදේශනය සැපයීමට ;

(ඇ) විශ්වවිද්‍යාලයේ අනුමතය ඇතිව, ජෛවරසායන විද්‍යාව, අණුක ජෛව වේද හා ජෛව තාක්ෂණ විද්‍යාව, අණුක ජීව විද්‍යා, ජෛව තොරතුරු, සෛලීය සහ අණුක ප්‍රතිශක්ති විද්‍යාව සහ ආශ්‍රිත අධ්‍යයන ක්ෂේත්‍රවල ප්‍රවීණතාව අත්කර ගෙන සිටන තැනැත්තන් නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා විභාග පැවැත්වීම සහ ඒ විභාගවලින් සමත්ව අතුරු ව්‍යවස්ථාවලින් නියමිත අනෙකුත් කොන්දේසි සපුරා, උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කරනු ලැබීම සඳහා සුදුස්සන්ව සිටින තැනැත්තන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීමට ;

(ඈ) විශ්වවිද්‍යාලයේ අනුමතය ඇතිව සහ අවශ්‍ය අවස්ථාවන්හි දී කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, ජෛවරසායන විද්‍යාව, අණුක ජෛව වේද හා ජෛව තාක්ෂණ විද්‍යාව, අණුක ජීව විද්‍යා, ජෛව තොරතුරු, සෛලීය සහ අණුක ප්‍රතිශක්ති විද්‍යාව සහ ආශ්‍රිත අධ්‍යයන ක්ෂේත්‍රවල පිරිනැමිය යුතු උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා නිශ්චය කිරීමට ;

(ආ) (ඔ) සහ (ඕ) අනුඡේද ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(ඔ) ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සහ කිසියම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව ගාස්තු ඉල්ලා සිටීමට සහ ලබාගැනීමට ;

(ඕ) ජෛවරසායන විද්‍යාව, අණුක ජෛව වේදය, ජෛව තාක්ෂණ විද්‍යාව, අණුක ජීව විද්‍යා, ජෛව තොරතුරු, සෛලීය සහ අණුක ප්‍රතිශක්ති විද්‍යාව සහ ආශ්‍රිත අධ්‍යයන ක්ෂේත්‍රවල පුහුණු පාඨමාලා හෝ වැඩමුළු ලෙස දැනුම ප්‍රචාරණය සහ කුසලතා පුහුණුව සඳහා වන කටයුතු පැවැත්වීමට සහ ඒවාට සහභාගී වීමට ; සහ

(ක) මේ ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති බලතලවලට ආනුෂංගික හෝ අනුයායී වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීමට." ;

(2) එහි 5 වන ඡේදයේ -

(අ) (5) වන අනුඡේදය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(5) අධ්‍යක්ෂවරයා රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ඔහුගේ ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක දී, එකී නොහැකියාව සිදුවීමෙන් දින හතක් ඇතුළත, අධ්‍යක්ෂවරයාගේ කාර්ය සිදු කරගෙන යාම සඳහා සුදුසු යයි උපකුලපතිවරයා විසින් සලකනු ලැබිය හැකි යම් වැඩපිළිවෙලක් සකස් කරනු ලැබිය යුතුය. එවැනි වැඩපිළිවෙළක් සකස් කරන තෙක් මහාචාර්යවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ආයතනයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයකු ඒ ධුරයේ එදිනෙදා කාර්ය කරගෙන යා යුතුය." ;

(ආ) (6) වන අනුඡේදයේ "ලේඛකාධිකාරීවරයා අධ්‍යක්ෂවරයාගේ කාර්ය ඉටු කළ යුතු ය." යන වචන වෙනුවට "මහාචාර්යවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ආයතනයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයකු අධ්‍යක්ෂවරයාගේ කාර්ය ඉටු කළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එහි 6 වන ඡේදයේ (1) වන අනුඡේදයේ "ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයකු ද වන්නේ ය." යන වචන වෙනුවට "ශාස්ත්‍රීය කමිටුවේ සහ පර්යේෂණ සහ උසස් උපාධි කමිටුවේ සාමාජිකයකු ද වන්නේ ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(4) එහි 7 වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරිමෙන් :-

"07. ආයතනය පහත සඳහන් අංශවලින් සමන්විත විය යුතු ය :-

(අ) කළමනාකරණ මණ්ඩලය ;

(ආ) ශාස්ත්‍රීය කමිටුව ;

(ඇ) පර්යේෂණ සහ උසස් උපාධි කමිටුව ;

(ඈ) එක් එක් උපාධි, අභිඥාන පත්‍ර හෝ සහතිකපත්‍ර වැඩසටහනේ අධ්‍යයන මණ්ඩල ; සහ

(ඉ) ආයතනයේ අධිකාරීන් ලෙස නියමාවලිය මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් මණඩල." ;

(5) එහි 8 වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඃ-

"08. (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලය ආයතනයේ ශාස්ත්‍රීය සහ විධායක මණ්ඩලය විය යුතු අතර එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය. ඃ-

(1) නිලබලයෙන් පත්වන සාමාජිකයන් හත් දෙනකුගෙන්, එනම් -

(අ) සභාපතිවරයා විය යුතු අධ්‍යක්ෂවරයා ;

(ආ) උසස් අධ්‍යාපන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නාමිකයකු ;

(ඇ) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නාමිකයකු ;

(ඈ) කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ අධ්‍යක්ෂවරයා ;

(ඉ) විශ්වවිද්‍යාලයේ ජෛවරසායන සහ අණුක ජෛව වේද අංශාධිපති ;

(ඊ) විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා ;

(උ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපතිවරයා ;

(2) තාක්ෂණය, අධ්‍යාපනය, නීතිය සහ පරිපාලනය පිළිබඳ විශේෂඥතාව ඇති, විශිෂ්ටත්වයට පත් සහ අවම වශයෙන් වසර විස්සක පළපුරුද්දක් සහිත තැනැත්තන් අතරින් කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයන් හතර දෙනකු; සහ

(3) නම් කරනු ලබන සාමාජිකයන් හය දෙනකු, එනම් -

(අ) පනතේ 44 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (vii) වන ඡේදය ප්‍රකාර කොමිෂන් සභාව විසින් පත්කළ සාමාජිකයන් අතරින් පාලක සභාව විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු ;

(ආ) විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් එහි සාමාජිකයන් අතරින් නම් කරනු ලබන, විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අනුමත කරන ලද නියෝජිතයන් දෙදෙනකු ;

(ඇ) ආයතනයේ ස්ථිර ආචාර්යවරුන් අතරින් අධ්‍යයන කමිටුව විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු." ;

(6) එහි 9 වන ඡේදයේ -

(අ) (3) වන සහ (4) වන අනුඡේද ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්ඃ-

" (3) අධ්‍යක්ෂවරයා වෙත යවනු ලබන පිටපතක් ද සමඟ නම් කිරීමේ බලධරයා අමතා යවනු ලබන ලිපියක් මඟින් ඕනෑම අවස්ථාවක මණ්ඩලයේ යම් නම් කළ යම් සාමාජිකයකුට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(4) අධ්‍යක්ෂවරයා වෙත යවනු ලබන පිටපතක් ද සමග කොමිෂන් සභාවේ සභාපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් මණ්ඩලයේ පත්කළ යම් සාමාජිකයකුට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය." ;

(ආ) (7) වන අනුඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඃ-

"(7) යම් රැස්වීමක ගණපූර්ණය මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් සියයට පනහකට නොඅඩු විය යුතු ය." ;

(7) එහි 10 වන ඡේදයේ (1) වන අනුඡේදයේ (උ) අනු-අනුඡේදයේ "ජෛව රසායන විද්‍යාව, අණුක ජෛව වේදය හා ජෛව තාක්ෂණය සම්බන්ධයෙන් ප්‍රදානය කරනු ලැබිය යුතු උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සහ එවැනි සහතික හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සඳහා සුදුසුකම් ලැබීම පිණිස, ශිෂ්‍යයන් විසින් අනුගමනය කළ යුතු අධ්‍යයන පාඨමාලා" යන වචන වෙනුවට "ජෛවරසායන විද්‍යාව, අණුක ජෛව වේද හා ජෛව තාක්ෂණ විද්‍යාව, අණුක ජීව විද්‍යා, ජෛව තොරතුරු, සෛලීය සහ අණුක ප්‍රතිශක්ති විද්‍යාව සහ ආශ්‍රිත අධ්‍යයන ක්ෂේත්‍ර සම්න්ධයෙන් ප්‍රදානය කරනු ලැබිය යුතු උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා සහ එවැනි සහතික පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සඳහා සුදුසුකම් ලැබීම පිණිස, ශිෂ්‍යයන් විසින් අනුගමනය කළ යුතු අධයයන පාඨමාලා" යන වචන ආදේශ කිරීමෙන් ;

(8) එහි 11 වන ඡේදයේ -

(අ) (1) වන අනුඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(1) පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ශාස්ත්‍රීය කමිටුවක් තිබිය යුතු ය :-

(අ) සභාපතිවරයා විය යුතු අධ්‍යක්ෂවරයා ;

(ආ) ඔවුන්ගේ පත්කිරීම්වල ස්ථිර කරනු ලැබ ඇති පරිදි ආයතනයේ ඉගැන්වීම් සිදුකරන ආයතනයේ ආචාර්යවරු සහ වෙනත් කාර්යමණ්ඩලය ;

(ඇ) ආයතනයේ සියලු වැඩසටහන් සම්බන්ධිකාරකවරුන් සහ සහකාර වැඩසටහන් සම්බන්ධිකාරකවරුන් ;

(ඈ) එක් එක් උපාධි වැඩසටහන සඳහා එක් සාමාජිකයකු බැගින් බාහිර කථිකාචාර්යවරු අතරින් පත්කරනු ලබන්නන් ;

(ඉ) අදාළ මණ්ඩප, ආයතන සහ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අංශ හෝ ආයතනය සමග ඒකාබද්ධ උපාධි වැඩසටහන් පවත්වනු ලබන වෙනත් විශ්වවිද්‍යාල විසින් පත් කරනු ලබන ඒකාබද්ධ උපාධි වැඩසටහන්වල සියලු සම්බන්ධීකරකරවරුන් ; සහ

(ඊ) එක් එක් උපාධි, අභිඥාන පත්‍ර හෝ සහතික පත්‍ර වැඩසටහනේ අධ්‍යයන මණ්ඩලවල සභාපතිවරුන්." ;

(ආ) (3) වන සහ (4) වන අනුඡේද ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(3) 9 වන ඡේදයේ (2). (4) සහ (5) වන අනුඡේදවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ශාස්ත්‍රීය කමිටුවේ එක් එක් සාමාජිකයා සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) ශාස්ත්‍රීය කමිටුවේ රැස්වීමක ගණපූරණය, අනුයුක්ත කළ සාමාජිකයන් ඇත්නම් ඔවුන් බැහැර කර එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් සියයට පනහකට නොඅඩු විය යුතු ය." ;

(9) එහි 12 වන ඡේදයට ඉක්බිතවම පහත දක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් -

"12අ. (1) පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු පර්යේෂණ සහ උසස් උපාධි කමිටුවක් තිබිය යුතු ය :-

(අ) ආයතනයේ සියලු ස්ථිර මහාචාර්යවරු හෝ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු ;

(ආ) ශාස්ත්‍රීය කමිටුව විසින් නම් කරනු ලබන, (අ) අනුඡේදයේ සඳහන් සාමාජිකයන් හැර, ආයතනයේ ස්ථිර කරන ලද අධ්‍යයන කාර්යමණ්ඩලයේ ආචාර්යවරු තුන්දෙනකු ; සහ

(ඇ) ආයතනය විසින් භාරගත් පර්යේෂණ ක්ෂේත්‍රවල කීර්තිමත් සේවාවක් ඉටුකර ඇති තැනැත්තන් අතරින් මණ්ඩලය විසින් පත් කරනු ලබන විද්‍යාඥයන් තුන්දෙනකු;

(2) 1 වන අනුඡේදයේ සඳහන් සියලු සාමාජිකයන් අතරින් සභාපතිවරයා නම් කරනු ලැබිය යුතු අතර ලේකම්වරයා (1) වන අනුඡේදයේ (ආ) අනු-අනුඡේදයේ සඳහන් සාමාජිකයන් අතරින් තෝරා පත් කරගනු ලැබිය යුතු ය.

(3) පර්යේෂණ සහ උසස් උපාධි කමිටුව විසින්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව, නිශ්චිත කාර්යයක් වෙනුවෙන් නිශ්චිත කාල සීමාවක් සඳහා එක් තැනැත්තකු හෝ එක් තැනැත්තෙකුට වැඩි ප්‍රමාණයක් අනුයුක්ත කරනු ලැබිය හැකි මුත් එසේ අනුයුක්ත කළ කිසිදු තැනැත්තෙකුට පර්යේෂණ සහ උසස් උපාධි කමිටුවේ කිසිදු රැස්වීමක දී ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය නොතිබිය යුතු ය.

(4) 9 වන ඡේදයේ (2), (4) සහ (5) වන අනුඡේදවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, පර්යේෂණ සහ උසස් උපාධි කමිටුවේ එක් එක් පත්කළ, නම් කළ සහ තෝරා පත් කරගත් සාමාජිකයන්ට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) පර්යේෂණ සහ උසස් උපාධි කමිටුවේ රැස්වීමක ගණපූර්ණය, අනුයුක්ත කළ සාමාජිකයන් අත්නම් ඔවුන් බැහැර කර, එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් සියයට පනහකට නොඅඩු විය යුතු ය.

(6) පර්යේෂණ සහ උසස් උපාධි කමිටුව අවශ්‍ය කවර අවස්ථාවක දී වුවද රැස්විය යුතු අතර, කෙසේ වෙතත් එක් එක් වර්ෂය තුළ දී වාර හයකට වඩා නොඅඩු වන පරිදි රැස් නොවිය යුතු ය.

12 ආ. (1) අධ්‍යයන මණ්ඩලයක් පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු යː-

(අ) ස්වකීය පත් කිරීමෙහි ස්ථිර කරනු ලැබ ඇති අදාළ උපාධි අභිඥාන පත්‍ර හෝ සහතික පත්‍ර වැඩසටහනේ ඉගැන්වීම සිදු කරන්නා වූ ආයතනයේ ස්ථිර කරන ලද ආචාර්යවරු ; සහ

(ආ) ජෛවරසායන විද්‍යාව, අණුක ජෛව වේද හා ජෛව තාක්ෂණ විද්‍යාව, අණුක ජීව විද්‍යා, ජෛව තොරතුරු, සෛලීය සහ අනුක ප්‍රතිශක්ති විද්‍යාව සහ ක්ෂේත්‍ර ආශ්‍රිත අධ්‍යයන පිළිබඳව විශේෂඥතාව ඇති, විශිෂ්ටතාවයට පත් සහ අවම වශයෙන් වසර විස්සක පළපුරුද්දක් සහිතවූ ද බාහිර පදනම මත ආයතනයේ ඉගැන්වීම් සිදුකරන තැනැත්තන් අතරින් ශාස්ත්‍රීය කමිටුවේ නිර්දේශය මත සහ මණ්ඩලයේ අනුමතය ඇතිව අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනකු.

(2) අධ්‍යයන මණ්ඩලයේ සභාපතිවරයා සහ ලේකම්වරයා (1) වන අනුඡේදයේ (අ) අනු-අනුඡේදයේ සඳහන් සාමාජිකයන් අතරින් පත්කරනු ලැබිය යුතු ය.

(3) අදාළ අධ්‍යයන මණ්ඩලය විසින්, උගන්වනු ලබන උපාධි, අභිඥාන පත්‍ර හෝ සහතික පත්‍ර පාඨමාලාව හෝ පර්යේෂණ සංරචයක් සමග උගන්වනු ලබන උපාධිය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම කළයුතු අතර එහි සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම පිළිබඳ ශාස්ත්‍රීය කමිටුවට වගකිව යුතු ය." ;

(10) එහි 20 වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ː-

"20. මේ නියමාවලියෙහි -

"පනත" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අදහස් වේ ;

"උචිත සාධන පත්‍රය" යන්නට, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ ඒ පදයට දී ඇති අර්ථමය තිබිය යුතු ය ;

"අතුරු ව්‍යවස්ථාව" යන්නට, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ ඒ පදයට දී ඇති අර්ථයම තිබිය යුතුය ;

"උසස් උපාධි" යන්නෙන්, ආයතනය විසින් පවත්වනු ලබන සහ විශ්වවිද්‍යාලය විසින් ප්‍රදානය කරනු ලබන දර්ශනපති සහ ආචාර්ය උපාධි අදහස් වේ ;

"උසස් අධ්‍යාපන ආයතනය" යන්නට, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ ඒ පදයට දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"ආචාර්යවරයා" යන්නට, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ ඒ පදයට දී ඇති අර්ථයම තිබිය යුතු ය ; සහ

"විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ."

EOG 06 - 0124

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.